කලා නිදහස උලාකමින් තනන කොටින්ට උඩ ගෙඩි දෙන චිත්‍රපටවලට ඉඩ දෙමුද?

❒ සරත් වීරසේකර

❒ සුළඟ එනු පිණිස චිත්‍රපටයෙන්

අප මුහුණ දෙන ත්‍රස්තයන්ගේ ප්‍රධාන අරමුණ අපේ මාතෘ භූමිය දෙකඩ කිරීමයි. එයට හේතුන් ලෙස උන් පෙන්වන්නේ ලංකාවේ බහුතරය වන සිංහල ජාතිය විසින් දෙමළ ජාතිය නිරතුරුවම තලා පෙළීම, සිංහලයන් යනු සාරධර්මයන්ගෙන් තොර, ශීලාචාර සංස්කෘතියක් නැති අමන ජාතියක් වීම සහ, එවන්වූ බහුතරයකගෙන් දෙමළ ජනයා වෙත "සාධාරණයක්" ඉෂ්ටවීම කිසිසේත්ම බලාපොරොත්තු විය නොහැකි වීම, යනාදීන්ය. එබැවින් එවැනි ජාතියකට එරෙහිව බලය යොදා විසඳුමක් ලගාකරගනු විනා වෙනත් විකල්පයක් නොමැති බැව් හඟවන ත්‍රස්තයෝ ඒ බැව් ඒත්තු ගැන්වීම සඳහා ලෝක ප්‍රජාව ඉදිරියේ සිංහල ජාතිය පිළිකුල් කරවීමේ නිරන්තර ප්‍රචාරක ප්‍රයත්නයන්හි යෙදී සිටමින්, තමන් ත්‍රස්තවාදීන් නොව, දෙමළ ජනයාගේ විමුක්තිය උදෙසා සටන් කරන "විමුක්තිකාමීන්" පිරිසක් බැව් පෙන්වීමට තැත් කරති.

එසේ තම වැඩපිළිවෙළ "සාධාරණීය" කරන ත්‍රස්තවාදී යක්ෂයෝ ඊළම් රාජ්‍යය බිහි කිරීම උදෙසා අහිංසක සිංහල මව්වරු කැතිගා, කපාකොටා මරති. මව්කිරි උරන කිරිසප්පයෝ උදුරා, දෙකකුලෙන් ඔසවා පොළොවේ ගසති. අහිංසක නිරායුද සිංහල ගොවියන් කුඹුරේම වෙඩි තබා ඝාතනය කරති. යක්ෂයෝ මෙසේ හැසිරෙද්දී ත්‍රස්තවාදී ප්‍රේතයෝ අනේකවූ දොලපිදේනිවලට ගිජුව විවිධාකාරයේ කර්තව්‍යයන් තුළින් සිංහල ජාතිය, සිංහල සොල්දාදුවා සහ සිංහල සංස්කෘතිය ලෝකයා ඉදිරියේ නිර්දය ලෙස පාවාදෙමින් ත්‍රස්තයන්ගේ ඉහතකී දීන ප්‍රචාරක කටයුතුවලට මුක්කු ගසති. ත්‍රස්ත කුම්භාණ්ඩයෝ එම පෙරේත වැඩ මහත් වූ අභිරුචියෙන් යුතුව වර්ණනා කොට ඒවාට උඩගෙඩි දෙති. එයට එරෙහි වන මහතුනට ගරහති. ප්‍රේතයන්ගේ, කුම්භාණ්ඩයින්ගේ ලෝකයේ, අප අසා ඇති පරිදි, මව්වරු, පියවරු නැත. දූ පුතුන්ද නැත. ඉන්නා සැවොම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එක්කෝ මල පෙරේතයන්ය, නැතහොත් මළ පෙරේතියන්ය. මිනිස් වෙසින් හැසිරෙන මෙම ප්‍රේතයන්ට, එබැවින්, තම වැදූ මව් හෝ තම දියණිය හෝ පාවා දෙමින් වුවද එම කටයුතු වල යෙදීම එතරම් ප්‍රශ්නයක් නොවේ. අප මුහුණ දෙන නොමිනිස්/තිරිසන් ත්‍රස්තවාදයේ යක්ෂ/ප්‍රේත ව්‍යූහය හෙවත් සංයුතිය එයයි. මෙම යුද්ධයෙන් ජය ගැන්මට නම් අනිවාර්යෙන්ම යක්ෂයින් විනාශ කළ යුතු අතරම අදාළ ප්‍රේත/කුම්භාණ්ඩයන්ද සහමුලින්ම පලවා හැරිය යුතුවේ. අපේ රණවිරුවෝ ත්‍රස්තවාදී යක්ෂයා විනාශ කිරීමට අභීතව සටන් වැද සිටින බැව් අප දනිමු. එසේ නම් ලක්වැසි සෙසු ජනතාව, ඉහතකී පිශාචයන් හඳුනාගෙන, ජාතියේ රැක්ම උදෙසා, උන් පන්නා දැමීමට, සාමූහිකව එක්විය යුතු කාලය දැන් එළඹ තිබෙන බැව් මාගේ හැඟීමයි.

දශක දෙකකට අධික කාලයක් ත්‍රස්තවාදී යුද්ධයට මුහුණදෙන අපේ රටේ මිනිසුන්, ත්‍රස්තවාදියා විසින් ක්‍රමානුකූලව කරගෙන යනු ලබන උතුරු නැගෙනහිර සිංහල ජනවාර්ගික ශුද්ධය, සිංහල-කුරිරු ඝාතන රැල්ල සහ එය ලෝකයා ඉදිරියේ "සාධාරණීය" කරන ඉහත කී ප්‍රචාරක ව්‍යාපාරය, ගැන නොදන්නා "බබ්බු" නොවෙති. රටේ පුරවැසියෙක් ලෙස යමෙක් එම යථාර්ථය දැන, නොදන්නාසේ සිටී නම් ඔහු නරුමයෙකි. නොදන්නේ නම් අමනයෙකි. දැනගෙන මුදලට කෑදර කමින් තම ජාතිය පාවාදී ත්‍රස්තයාට වක්‍රව සහය දේ නම් හේ ජාති භ්‍රෂ්ඨයෙකි.

සිංහලයාට එරෙහිව කෙරෙන ත්‍රස්තවාදය සාධාරණීය කිරීමට එම ජාතියේම කෙනෙක් යොදා ගන්නා විට එය අන්තර්ජාතික ප්‍රජාව ඉදිරියේ කෙතරම් ප්‍රබල අවියක් වනවාද යන්න ත්‍රස්තයෝ හොඳාකාරවම දනිති. ඒ නිසාම ඒ සඳහා සිංහලයන් නැඹුරු කර ගැන්මට ඔවුහු ලක්ෂ ගණනින් මුදල් විසි කරති. දොල පිදේනි පුදති. මුදලට තමාගේ ආත්මය නොව තම බිරිඳගේ ආත්මය පවා විකිණීමට සූදානමින් සිටිනවුන් සිටින අපේ රටේ, එවැන්නන් සොයා ගැන්ම අසීරු කරුණක් නොවේ. එසේ මුදලට ගිජුව ත්‍රස්තයාගේ අවශ්‍යතාවන් සපිරීමට එකඟ වන කෙනෙක් සිංහල ජාතිය, ත්‍රස්තයාට විරුද්ධව සටන් වදින සොල්දාදුවා සහ සිංහල සංස්කෘතිය ඉතාම සූක්ෂ්ම අයුරින් නිර්දය ලෙස හෙළා දකින කාලකණ්ණි සිනමා කෘතීන් නිපදවා ලෝකයා හමුවේ තබති. එය නරඹන ලෝකයාගේ සිත් සතන් තුළ සමස්තයක් වශයෙන් සිංහල ජාතිය පිළිබඳව පිළිකුල් හැඟීම ජනිත කරවා ඒ තුළින් "එවන් වූ ජාතියකට" විරුද්ධව සටන් වදින "දෙමළ විමුක්ති කොටියා" පිළිබඳ අනුකම්පාවක් ඇතිකරවීමට සෘජුව උපකාරී වෙති. ඉන්පසු ත්‍රස්තවාදී දෙමළ විදේශිකයින් "සිංහල කලාකරුවකු" විසින් "අන්තවාදීන්ගේ" තාඩන පීඩන ගර්ජන හමුවේ නොසැලී, නොබියව, සිංහල ජනසමාජයේ "යථාර්ථවාදී ස්වරූපය" පිළිබිඹු කරන එකී "කලාකෘතිය" ලක්ෂ ගණනින් පිටපත් කරවා සියලුම රටවලට බෙදාහරිති. සිංහල ජාතිය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ පිළිකුල් කරවා ත්‍රස්තයනට සිය අරමුණු කරා ළඟා කරවීමට සහාය දීමේ කුප්‍රකට ක්‍රියාදාමය එයයි. එසේ නම් මුදලට පෙරේතකමින් එසේ තමා ජනිත වූ මාතෘ භූමිය පාවා දෙන්නට ප්‍රේතයන් යැයි නොකියා වෙන කුමන නමකින් නම් හඳුන්වමුද?

ත්‍රස්ත ප්‍රචාරක කටයුතු වලට වක්‍රව දායක වන ඊනියා "සම්භාවය" කලා කෘතිවලින් අප ජාතිය පාවාදී ඇති අන්දම පිළිබඳ දැන් මඳක් විමසා බලමු. පුන් පොහෝ දිනයන්හි අහසේ බැබළෙන, ලොව කාන්තිමත් කරන චන්ද්‍රයාගේ නමටද නිගා දෙන අයුරින් සඳත් සඳහන් කොටගෙන නිර්මාණය කරන ලද එක් චිත්‍රපටයක, සිංහල සංස්කෘතියට, "සිංහල" සොල්දාදුවාට සහ බෞද්ධ භික්ෂූවට ඉතා දරුණු ලෙස පහර ගසා ඇති අන්දම අප මීට පෙරත් පෙන්වා දී ඇත. එහි සිංහල සොල්දාදුවා නිරූපනය කර ඇත්තේ කිසිම විනයක්, හික්මීමක් නැති, ආරක්ෂාව පතා බංකරයට වැදුණු දෙමළ තරුණියක් හිත් පිත් නැතිව දූෂණය කරන, මව් පියන් ඉදිරියේදී කිසිම ගරුත්වයකින් තොරව හැසිරෙන තිරශ්චීන අමනයෙක් ලෙසිනි. එම චිත්‍රපටයේ සටනේදී මියයන සෙබළාගේ බිරිඳ තම ස්වාමියාගේ චිතකය ගිනි නිවෙන්නටද පළමුව වෙන පුරුෂයෙකු කාමයෙන් මුසපත්ව වැළඳ ගනී. සොල්දාදුවා, මියගිය තම සෙබළ මිතුරා දැවෙන චිතකයේ ගිනිපෙල්ලකින් තම සිගරට්ටුව දල්වා ගනී. සිංහල සංස්කෘතිය ඉතාම අතාත්වික අයුරින් පාවාදී ඇති එම චිත්‍රපටයේ අවසානයේදී බෞද්ධ භික්ෂුවද සිවුර පඳුරක් මත තබා ඉහත කී දෙමළ තරුණිය හා රමනයෙහි යෙදෙනු හඟවයි. රූමත් දෙමළ යුවතිය දකින භික්ෂුව ඇය අමතා කියන වදන් මෙසේය.

ගමක් ගිනි තියන්න පුළුවන් ඇස් දෙකක් තොට තියෙනවා. තෝ දැක්කම චීවරය ඇතුළේ මෙහෙම උණුවෙනවා නම් යුනිෆෝම් එක ඇතුළේ ගිනිගන්න එක අහන්න දෙයක්ද? ඉංග්‍රීසි උප සිරැසි යොදා තනා ඇති මෙම චිත්‍රපටය විදෙස්හි ප්‍රදර්ශනය වනවිට ආර්ය සංඝරත්නයෙන් පැවතෙන අපේ සංඝයා වහන්සේ ගැන නරඹන්නන්ගේ සිත් තුළ ඇති වන හැඟීම කෙබඳු විය හැකිද? බෞද්ධ භික්ෂුව යනු ඉතා අසංවර, නොහික්මුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා ස්ත්‍රී දූෂකයෙක් ලෙස නොවේද? කොටි ත්‍රස්තවාදයට විරුද්ධව උද්ඝෝෂණය කරන බෞද්ධ භික්ෂූවගේ පැවැත්ම මෙබඳු නම් කොටියා විමුක්ති කාමියෙකු ලෙස හැඳින්වීමේ වරද කුමක්දැයි ඔවුන් සිතනු නිසැකය. අශෝක හඳගමගේ "මේ මගේ සඳයි" නමැති මෙම චිත්‍රපටය තුළින් සිංහල සොල්දාදුවා පමණක් නොව ඔහුගේ බිරිඳද, අහිංසක ගැමි සංස්කෘතියද, බෞද්ධ භික්ෂුවද ඉතාම පහත් ලෙස, ඉතාම අතාත්වික ලෙස පාවාදීමේ රහස කුමක්ද? ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති චිත්‍රපට උළෙලක මෙම චිත්‍රපටයට සම්මානයක් ලැබුණු අතර එම උළෙල සම්බන්ධයෙන් ඉන්දියාවේ හින්දු පුවත්පතෙහ පලකළ විස්තරය කියවා මාගේ නෙතට කඳුළක් නැගිණි. "මෙම උළෙලට විවිධ රටවල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම චිත්‍රපට ඉතා උසස් මට්ටමක පවතී. ඒ සෑම චිත්‍රපටයක් තුළින්ම ඒ ඒ රටේ භූගෝලීය පිහිටීම, සංස්කෘතිය සහ වෙසෙන මිනිසුන්ගේ චර්යාව පිළිබඳව මනා දැනීමක් ලබා ගත හැක" යනුවෙනි. අන්තර් ජාතික සම්මානයකින් පිදුම්ලත් හඳගමගේ මෙම චිත්‍රපටය තුළින් අපේ සංස්කෘතිය සහ ගැමි චර්යාව සම්බන්ධව පෙන්වනදේ ඇත්තෙන්ම සත්‍යද? අමූලික බොරුවකි. කොටි ත්‍රස්තවාදය සාධාරණීය කිරීමේ නිහීන ගෝලීය ප්‍රචාරක ව්‍යාපාරයට හඳගම දායක වී ඇත්තේ එසේය.

පසුගිය දින කිහිපය තුළ යම්කිසි ආන්දෝලනයකට ලක්ව තිබෙන අශෝක හඳගමගේ ජාතිය පාවාදීමේ නවතම වික්‍රමය "අක්ෂරයයි" එය නැරඹූ මාගේ මිතුරෙක් පැවසූ පරිදි සැකෙවින් එහි අන්තර්ගතව ඇත්තේ පියා තම දියණිය සරණ පාවා ගන්නා අන්දමත්, වයස අවුරුදු 13ක පමණ [illegible] "කාමුක හැඟීම්" සඵල කරගන්නා අන්දමත්ය. එම චිත්‍රපටයේ රඟන තරුණ මව (ඇය තම සැබෑ දිවියේ නම් මවක් විය නොහැකිය) සහ එම පුතා සම්පූර්ණ නිරුවතින් නාන බේසමක (බාත් ටබ්) ස්නානය කරන දර්ශනයක් ඇතුළත් වන අතර තරුණ [illegible] පුතාට ලිංගික හැඟීම් පහල වන අයුරු පෙන්වන බව එම චිත්‍රපටය නැරඹූ සංස්කෘතික අමාත්‍යංශයේ ලේකම්වරයා පවසා තිබුණි. තරුණ මවක් දැනුම් තේරුම් ඇති සිය පුතා සමග නිරුවතින් එකට නාන පවුල් කීයක් සිංහල සංස්කෘතිය තුළ හඳගම දැක හෝ අසා තිබේදැයි ඇසිය යුතුව ඇත. එය තමාගේ පුද්ගලික ජීවිතයේ අත්දැකීමක් විය හැකි වුවද එවන් වූ දර්ශනයක් චිත්‍රපටයකට ඇතුළත් කිරීමට තරම් සාහසික මානසිකත්වයක් ඔහුට ඇති වූයේ කෙසේද? තරුණ වියට පත්වෙමින් සිටින තමාගේම පුතා වෙතින් නිරතුරුවම තම ලිංගික අවශ්‍යතා තෘප්තිමත් කරගන්නා තරුණ මවක් පිළිබඳ තේමාවක් රැගත් මෙම චිත්‍රපටය කළවුන් නොව එය ප්‍රදර්ශනය කිරීම එරෙහි වන්නන් හඳගම සහ ඔහුගේ කණ්ඩායම හඳුන්වන්නේ විකෘතිකාමාතුරයන් ලෙසිනි. එය බැලීමට අකමැති කෙනෙක් නොබලා සිටිය හැකි යැයිද, බලා අකමැති නම් ශාලාවෙන් පිටවී [illegible] බලකරන්නේ නැතැයිද හඳගම පවසයි. ඔහුට අනුව මෙම චිත්‍රපටයට එරෙහි වන්නන් එසේ කරන්නේ එය "අශීලාචාර වැරදි කෝණයකින්" නරඹන හෙයිනි. අප හඳගමගේ "කෝණමානය" හොඳින් හඳුනන නිසා එහි ගැටලුවක් නැත. නමුත්

ත් සහ පුතෙක් එකට
නිරුවත්ව නා න සංස්කෘතියක් ඇත්තේ
සිරිලංකාවේ නොව හඳගමගේ මනෝ
ලෝකයේ ප වණක් බැව් අප කවුරුත්
දන්නා කරුණ කි. කලා උන සන්නි-
පාතයෙන් දෙ පලෙන්නන්ද, කලාහරිත-
යන්ද, කලාව අලෙවි කරමින් මුදල්
ගරන සරුව පින්තල දිසාපාමොක්-
වරුන්ද, මුදල ලැබේ නම්, තම බිරිඳ
දූෂණය කළ විත්තිකරුවෙක් වෙනු-
වෙන් වුවද පෙනී සිටීමට නොපැකි-
ලෙන සමහ ර පෙරකදෝරුවන්ද
මෙම චිත්‍රපට ය අග්‍රගන්‍ය යැයිද ප්‍රංශ
සම්මානයකි න් පිදුම්ලත් විශිෂ්ට
කෘතියක් යැයි ද, එය තහනම් කිරීමෙන්
හඳගමට දැඩි අසාධාරණයක් සිදුවී
ඇතැයිද මෙ රදෙති. මොවුන් ගැන
අප කලබල විය යුතු නැත. මන්ද,
ත්‍රස්ථ ප්‍රේත යන් පලවා හරින විට
උන්ට ඇලී සි ටින මෙවන් කුම්භාණ්ඩ-
යන්ද ඉබේම පැන දුවන බැවිනි.
"අක්ෂර ය" තහනම් කිරීම සම්-
බන්ධයෙන් හඳගම සහ ඔහුගේ සග-
යින්/ඇඳුරන් පවසන්නේ එය කලා-
කරුවකුගේ "අදහස් ප්‍රකාශ කිරීමේ

නිදහස" සම්පූර්ණයෙන්ම තප්පාදු කළ බවක් ලෙසිනි. එසේ ගමන් කරන විට පොලිස් නිලධාරියෙකු තමන්ගෙන් ප්‍රශ්න කළහොත් "අප කාටවත් හිරිහැරයක් කරන් නැහැ. කැමති කෙනෙක්ට අප දෙස බලන්න පුළුවන. අකමැති කෙනෙක්ට නොබලා ඉන්න පිළිවන්. බලලා අප්‍රිය නම් ඇස් දෙක පියා ගන්නත් පුළුවන්" යැයි පිළිතුරු දිය හැකිද? ඔවුන් නිදහසට කුමක් කීවත් ප්‍රසිද්ධ ස්ථානයක අශෝභන ලෙසට හැසිරීමේ වරදට හෝ කාන්තාවන් බිය ගැන්වීමේ වරදට හෝ ඔවුන් දෙපළ අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කිරීමට පොලිසියට බලය තිබේ. කලාව ඇති ප්‍රජාතන්ත්‍රවාදයත් එසේමය. කලාව තුළින් ලැබෙන නිදහස පාදඩලෙසට උපයෝගී කර නොගෙන දැහැනකාමී/ශිෂ්ට ලෙසට යොදා ගැන්ම කලාකරුවාගේ වගකීම වේ. එය එසේ සිදු නොවේ නම් එයට තහංචි දැමීමට අදාළ බලධාරීනට බලය තිබේ. ලොව සෑම රටකම, සිනමාව සම්බන්ධයෙන් රැඟුම් පාලක මණ්ඩලයක් තිබෙන්නේ එබැවිණි. කලාවේ, මොවුන් කියන අසීමිත නිදහසක් තිබේ නම් රැඟුම් පාලක මණ්ඩලයක් අවශ්‍ය වන්නේ ඇයි? කරුණු එසේ වුවද මෙම චිත්‍රපටය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන විට අපගේ රැඟුම් පාලක මණ්ඩලය නම් දෙනෙත් පියාගෙන සිටි බවක් අපට හැඟේ. එනමුත් දෙනෙත් හැර සිටිමින් ඒ පිළිබඳව නිසි තීරණයක් ගත් සංස්කෘතියක අමාත්‍යවරයාට අපගේ ප්‍රණාමය හිමි විය යුතුය. රැඟුම් පාලක මණ්ඩලයෙන් ගිලිහී ගිය යුතුකමක්/රාජකාරියක් ඇමැතිවරයා විසින් කර ඇති බැවිනි.

මිනිසා සහ තිරිසනා අතර වෙනස කියැවෙන, පැරණි වේදයෙහි අඩංගු, මාගේ ගුරුවරුන් විසින් මට කියා දී ඇති, කදිම ශ්ලෝකයක් මා මතකයට නැගේ. "ආහාර, නිද්‍ර, භය, මෛථුනංච, ධම්මේන හීනා පශුභි සමානා" යනුවෙනි. එනම් ආහාර, නින්ද, භය සහ සංසර්ගයේ යෙදීම යන සිව් කරුණු තිරිසනාට සහ මිනිසාට පොදු බවත්, මිනිසා තිරිසනාගෙන් වෙනස් වන්නේ විනය සහ හික්මීම යන කරුණු නිසා පමණක් බවත්ය. තිරිසන් ලෝකයේ සංසර්ගයේ යෙදෙන විට මව, පියා, නැගණිය කියා වෙනසක් නැත. මිනිස් ලොවේ එම වෙනස පවත්වාගෙන යනුයේ මිනිසා තුළ තිබෙන විනය සහ හික්මීම තුළිනි. පුතෙක් මවක් සමග හෝ පියෙක් දියණියක් සමග හෝ රමණයේ යෙදේනම් එතන හික්මීමක්, විනයක් නොමැති හේතුවෙන්ම ඔවුහු තිරිසනුන් හා සම වෙති. එවන් "තිරිසන්" දෙයක් තේමාව කරගෙන මනඃකල්පිත ලෙසින් හෝ නිර්මාණයකට යොදා ගැනේ නම් එහිදී ඉස්මතු වන්නේ එයට සහභාගි වූ සැමගේම තිරිසන් බවම නොවේද? එම තිරශ්චීන "හෙළුව", ශුද්ධ වූ "කලාවේ නිදහස" නමැති සළුවෙන් ආවරණය කිරීමට යමෙක් තැත් කළත් එය නිශ්ඵල වෑයමක් වන්නේ, "කලා නිදහස" යනු ඕනෑම පාදඩ නිර්මාණයක් කොට එහි නිරුවත වසා ගැන්මට පාවිච්චි කරන කාලවර්ණ ඉටි කොළයක් නොවන නිසාය. චිත්‍රපටයක් නරඹා අප්පිරියාවෙන් ශාලාවෙන් පිටවේ නම්, කුමන මාදිලියේ කෘතහස්ත සිනමා වේදියෙකු ලවා සාධාරණීය කිරීමට වෑයම් කළද, එය චිත්‍රපටයක් නොව කුණු බාල්දියකි.

කලාකරුවා රටක සාරධර්මවලට සහ සංස්කෘතියට ගරුකළ යුතුය. ප්‍රවීණ කලාකරුවා කෙතරම් කටුක දෙයක් ඉදිරිපත් කළද අවසානයේ සාරධර්ම, මිනිසත් කම, මානව හිතවාදී බව ඉස්මතු කරලීමේ සුන්දර වෑයමකද ඔහු නිරතවෙයි. නියම කලාකරුවා සිය නිර්මාණයන් කරන්නේ තමාගේ හැදියාව තුළින්ලත්, ලෝ පිළිගත්, උතුම් මානව හිතවාදී සාරධර්මවලින් සැදි සීමාවන් තුළ හිඳිමින්ය. යම් කලාකරුවෙක් එය තමාට තහංචි දැම්මක්සේ සලකයි නම් එය කලාවේම අභාග්‍යයකි.

තම මව්බිම, දේශය, මුහුණපාන බැරෑරුම් අවස්ථාවලදී කලාකරුවාද දේශප්‍රේමී විය යුතු යැයි මහා ගත්කරු රබීන්ද්‍රනාත් තාගෝර් වරෙක පවසා ඇත. කලාකරුවෙකුට, ශාරීරික සෞඛ්‍ය වර්ධනයට හෝ තම මොළය වර්ධනයට හෝ නානාවිධ ඖෂධ වර්ගයන් එන්නතක් මගින් ලබාදිය හැකි වුවද, දේශප්‍රේමීත්වය, සාරධර්ම යනාදිය නම් කාහටවත් එන්නතක් මගින් හෝ ඉන්ජෙක්ෂන් කටුවකින් හෝ ශරීරගත කළ හැකි දියරයන් නොවේ. එය හදවත තුළ ජනිත කරවන්නේ පළමුව තමා හදාවඩන් මාපියන්ය. දෙවනුව තමාට සිප්සත දෙන පාසල හා ගුරුවරුන්ය. තෙවනුව තමා ඇසුරු කරන පඬිවරුන් හා කළණ මිතුරන්ය. මෙම ත්‍රිත්වයේ නිසි පහස නොලැබූ තැනැත්තාට දේශයක් නැත. ගුරුවරු මව්පියවරු හෝ සහෝදරියන් නැත. සංස්කෘතියක්ද නැත.

ටිබෙට් ජාතික මහින්ද හිමි බොහෝ රසවත් කවි නිර්මාණය කොට ඇත. එයින් මා වඩාත් සිත්ගත් කවක් මෙසේය.

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් දැය සමය වෙතේ
පුද නොකළොත් එයින් පුතේ
මෙලොවට කිසි ඵලක් නැතේ....

තමන් ලැබූ ජීවිතයෙන් බිඳක් හෝ තමා ජනිත වූ දේශයේ යහපත උදෙසා නොයොදන්නේ නම් ඒ ලැබූ ජීවිතයෙන් කිසි ඵලක් වේද යනු එහි තේරුමයි. එසේනම්, ඊට අනුව, අද රට මුහුණ පා සිටින අතිශය බැරෑරුම් ප්‍රශ්නය වන ත්‍රස්තවාදය ජය ගැනීමට පුරවැසියන් වශයෙන් අප අපගේ ජීවිතයෙන් කවරනම් කොටසක් දැය වෙනුවෙන් මෙතෙක් පරිත්‍යාග කොට තිබේදැයි දැන්වත් විමසා බලනු වටී. ත්‍රස්තයාට එරෙහිව සටන් වදින සොල්දාදුවා තම ජීවිතයේ කොටසක් නොව මුළු ජීවිතයම දේශය වෙනුවෙන් කැපකොට ඇත. නමුත් අපේ රටේ සිනමා කලාකරුවාගෙන් රටේ දැවෙන ප්‍රශ්නයක් වන ත්‍රස්තවාදය දුරුකිරීම අරභයා මෙතෙක් සිදුවී ඇති සේවය කුමක්ද? අහෝ ඛේදයකි. අද වනතුරුත් ඔවුන් කර ඇත්තේ පෙර කී පරිදි ත්‍රස්තයාටම වාසිවන පරිද්දෙන් ජාතිය පාවාදෙන, සෙබළා හා සෙබළ බිරිය අවතක්සේරු කරන, සටන් වදින සොල්දාදුවා අධෛර්යමත් කරන, බෞද්ධ භික්ෂුවට නිගරු කරන, සමස්ත සිංහල සංස්කෘතියම ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ හෑල්ලුවට ලක්කරන, නීච කෘතීන් පමණක්ම නේද? එය එසේ නොවේ නම්, ත්‍රස්තවාදය නැමැති ජාතික ප්‍රශ්නය විසඳීමට දායක වීම සඳහා අපේ සිනමා කලාකරුවන් හා කෘතහස්ත යැයි කියන වයෝවෘද්ධ සිනමා විශාරදයන් විසින් මෙතෙක් කර ඇති සේවය කුමක්ද?

අපි මෙතෙක් බලා සිටියෙමු. අහිංසක සිංහල හා දෙමළ ජනතාව අතර සුහදතාවය වර්ධනය කරවන, කොටි පාලන පෙදෙස්වල දුක්විඳින අහිංසක දෙමළ ජනතාවගේ ශෝකාන්තය පිළිබිඹු කරන, බලෙන් පැහැරගෙන යන දෙමළ දරුවන්ගේ මව්වරුන්ගේ කඳුළු කතාව කියැවෙන සහ ත්‍රස්තයන්ගේ මිලේච්ඡ ඝාතන ලොවට පෙන්වා උන්ව ජාත්‍යන්තර ප්‍රජාවගේ පිළිකුලට ලක්කරවන සිනමාවක් නිර්මාණවන තුරු අපි බලා සිටියෙමු. එසේම සෙබළාගේ දිරිය වඩවන, සෙබළ බිරියගේ උතුම් කැපවීම ඉස්මතුකරවන, දේශයට පණපොවන, දේශානුරාගය හදවතට කාවද්දන එකදු සිනමා කෘතියක් හෝ එළි දක්වන කලාකරුවෙකු උණුසුම් හදින් පිළිගැනීමට අපි මල් මාලා ගොතා මෙතෙක් බලා සිටියෙමු. එම කුසුම් පරවී, වියළී, විසිරී, සුළඟේ පාවී බිමට පතිත වී මව්බිම සිපගන්නා තුරුත් එවන් කෙනෙක් හමුවීමට අපට වාසනාව නොතිබුණි. වියළී බිමට වැටුණු මලින් හෙට දින නැවත මල් හට ගනු ඇත. එයින්ද මල් දමක් ගොතා, සසර සැරිසරන අපේ ජීවිත මෙන්ම, එම මල්ද පරවී මිලිනව යාමට මත්තෙන්, දැයේ හද ගැස්ම හඳුනන, දැහැනකාමී සිනමාවක් නිර්මාණය කරන උතුම් සිනමා කරුවකුගේ ගෙලෙහි එය පැළැන්දීමට අවස්ථාවක් උදාවනතුරු අපි නොඉවසිල්ලෙන් තවමත් බලා සිටිමු.■